# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - ශ්‍රී ලංකාව

## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

### බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

### 2025 නොවැම්බර්

### MABS 1114 - බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය (ආදි බෞද්ධ, පශ්චාත් කාලීන ථෙරවාද,මහායාන සහ වජ්‍රයාන)

ප්‍රශ්න සංඛ්‍යාව 06 කාලය: පැය දෙකයි (02)

ප්‍රශ්න **තුන(03)**කට පමණක් පිළිතුරු සපයන්න.

01. බුද්ධ වචනය පිළිබඳ මූලික වර්ගීකරණ පරීක්ෂා කොට පාලි ත්‍රිපිටකය සම්පාදනයෙහිලා පළමු ධර්ම සංගායනාවේ දායකත්වය අගයන්න. (ලකුණු 20 යි.)

02. පාලි සූත්‍ර පිටකයේ කොටස්, අනු කොටස් හා අන්තර්ගතය කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20 යි.)

03. ථෙරවාද අභිධර්ම පිටකයේ ස්වභාවය හා එහි බෞද්ධ නිකායාන්තර විකාශය පැහැදිලි කරන්න.
හෝ
විවිධාකාර පුද්ගල වර්ගීකරණ පිළිබඳව පුග්ගලපඤ්ඤත්තිප්පකරණය ඇසුරින් අධ්‍යයනයක් කරන්න. (ලකුණු 20 යි.)

04. පාලි අටුවා සාහිත්‍යයේ ආරම්භය හා අන්තර්ගතය පිළිබඳ විචාරාත්මක සාකච්ඡාවක් කරන්න.
හෝ
ථෙරවාද ටීකා සාහිත්‍යයේ ආරම්භය හා අනුක්‍රමික සංවර්ධනය හඳුන්වා දෙන්න. (ලකුණු 20 යි.)

05. සංස්කෘත මහායාන සූත්‍ර පිළිබඳව විවරණයක් කරන්න. (ලකුණු 20 යි.)

06. චීන බෞද්ධ මූලාශ්‍රයවල ස්වභාවය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් කරන්න. (ලකුණු 20 යි.)

***

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - ශ්‍රී ලංකාව

## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

### බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

### 2025 නොවැම්බර්

## MABS 1124 - බුදුසමයේ මූලික ඉගැන්වීම්

ප්‍රශ්න සංඛ්‍යාව 06 කාලය: පැය දෙකයි (02)

---

ප්‍රශ්න **තුන(03)කට** පමණක් පිළිතුරු සපයන්න.

---

01. සමකාලීන වෙනත් භාරතීය ආගමික ශාස්තෘවරුන් හා සසඳන කල්හි බුදුරජාණන්වහන්සේ තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

02. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය පිළිබඳ ඔබගේ අවබෝධය පැහැදිළි කරමින් ත්‍රිවිධාකාර තෘෂ්ණාව නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20 යි.)

03. මානව පුද්ගලත්වයේ පදනම වශයෙන් පඤ්චස්කන්ධය පිළිබඳ බෞද්ධ විශ්ලේෂණය පිළිබඳ අගැයීමක යෙදෙන්න. (ලකුණු 20 යි.)

04. බෞද්ධ කර්මවාදය හා එහි සුවිශේෂී ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක යෙදෙමින් ක්‍රියා සහ ඒවායෙහි විපාක පිළිබඳ වෙනත් භාරතීය ආගමික හා දාර්ශනික මතවලින් බෞද්ධ කර්මවාදය වෙනස් වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 20 යි.)

05. නිර්වාණාවබෝධයෙහි ලා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ආචාරවිද්‍යාත්මක වැදගත්කම සහ එහි ප්‍රායෝගික අදාලත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

06. සතිපට්ඨාන සූත්‍රය වෙත විශේෂ අවධානය යොමුකර විදර්ශනා ඥානය වර්ධනය කිරීමෙහිලා එහි වැදගත්කම මතුකර දක්වමින් බෞද්ධ භාවනාවේ වැදගත්කම අගැයීමට ලක්කරන්න. (ලකුණු 20 යි.)

***

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - ශ්‍රී ලංකාව

## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

### බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

### 2025 නොවැම්බර්

## MABS 1134 - බුදුසමයේ බුද්ධිමය ඉතිහාසයඃ ථේරවාදය සහ චතුර්විධ බෞද්ධ සම්ප්‍රදාය

ප්‍රශ්න සංඛ්‍යාව 06 | කාලයඃ පැය දෙකයි (02)

ප්‍රශ්න **තුන(03)කට** පමණක් පිළිතුරු සපයන්න.

01. ප්‍රාග් බෞද්ධ ආගමික සහ දාර්ශනික අදහස් අධ්‍යයනය කිරීම බුදුදහම තේරුම් ගැනීම සඳහා උපයෝගී වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

02. බුද්ධ කාලීන ෂඩ්ශාස්තෘවරුන්ගේ ආගමික සහ දාර්ශනික අදහස් ගෙනහැර පාමින් ඒ පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිචාරය පෙන්වා දෙන්න. (ලකුණු 20 යි.)

03. මහාසංඝික, සර්වාස්තිවාද සහ වාත්සීපුත්‍රීය නිකායිකයන්ගේ ප්‍රධාන ඉගැන්වීම් පැහැදිළි කොට ඒ පිළිබඳ ථේරවාදීන්ගේ මතය කුමක්දැයි විභාග කරන්න. (ලකුණු 20 යි.)

04. හීනයාන යැයි කියනු ලබන සම්ප්‍රදායයන්ට ප්‍රතිවිරුද්ධව මහායාන සම්ප්‍රදාය බිහි වීමට හේතු කවරේදැයි විමසන්න. (ලකුණු 20 යි.)

05. මාධ්‍යමික සහ යෝගාචාර සම්ප්‍රදායයන්හි මූලික ඉගැන්වීම්වලට අදාළ මූලබීජ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් තුළ දැකිය හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි.)

06. පෙරදිග ආසියාතික මහායාන රටවල්වලට (චීනය, කොරියාව සහ ජපානය) උයත් බෞද්ධ සම්ප්‍රදායයන්හි එන මූලික ඉගැන්වීම් ගෙනහැර දක්වන්න. (ලකුණු 20 යි.)

***

**නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - ශ්‍රී ලංකාව**

**පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය**

**බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය**

**2025 නොවැම්බර්**

# MABS 1144 - බෞද්ධ ඥාණ විභාගය හා ආචාරවිද්‍යාව.

ප්‍රශ්න සංඛ්‍යාව 06 　　　　　　　　　　　　　　　　　　කාලය: පැය දෙකයි (02)

---

ප්‍රශ්න **තුන(03)කට** පමණක් පිළිතුරු සපයන්න.

---

01. පෙර'පර දෙ-දිග ඥාණවිභාගයෙහි නිර්වචන පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20 යි.)

02. බෞද්ධ ඥාණමාර්ග සැකෙවින් දක්වා භාවනාමය ඥාණයෙහි ප්‍රායෝගික භාවිතය ප්‍රකට කරන්න. (ලකුණු 20 යි.)

03. නිර්වාණගාමී ප්‍රතිපදාව සංවිධිත ව විවරණය කොට නිර්වාණයෙහි අවාච්‍යත්වය විශද කරන්න. (ලකුණු 20 යි.)

04. බුදුසමයෙහි එන අධිභෞතික ඉගැන්වීම් දශ අව්‍යාකෘත ප්‍රශ්නාශ්‍රයයෙන් සනාථ කරන්න. (ලකුණු 20 යි.)

05. බෞද්ධ ආචාරධර්මවල නිර්ණායකයන් අදාළ මූලාශ්‍රයාශ්‍රයයෙන් විමසන්න. (ලකුණු 20 යි.)

06. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට (02) සප්‍රමාණවත් සටහන් සපයන්න.

   1. අධි ආචාර විද්‍යාව
   2. ප්‍රාමාණික ආචාරවිද්‍යාව
   3. පිං-පව්/ කුසල්-අකුසල්
   4. බුද්ධිවාදය
   5. අනුභූතිවාදය (ලකුණු 20 යි.)

***

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - ශ්‍රී ලංකාව

## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

### බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

### 2025 නොවැම්බර්

### MABS 1254 - බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය

### (ආදි බෞද්ධ සූත්‍ර පදනම් කර ගනිමින්)

ප්‍රශ්න සංඛ්‍යාව 06 — කාලය: පැය දෙකයි (02)

---

ප්‍රශ්න **තුන(03)**කට පමණක් පිළිතුරු සපයන්න.

---

01. ප්‍රාග් බෞද්ධ භාරතයේ පාලන ක්‍රමවේද හඳුන්වා ඒවා පිළිබඳ බෞද්ධ විචාරය සාකච්ඡා කරන්න.
(ලකුණු 20 යි.)

02. බුදු දහමේ පෙන්වා දෙන දැහැමි පාලන ක්‍රමවේද පිළිබඳ විමර්ශනයක් කරන්න.
(ලකුණු 20 යි.)

03. පරමාදර්ශී රාජ්‍ය සංකල්පය බුද්ධදහම තුළ ඇගයීමට ලක් වන අයුරු සාකච්ඡා කරන්න.
(ලකුණු 20 යි.)

04. සාර්ථක ව්‍යාපාර කළමනාකරුවෙකු සතු විය යුතු කුසලතා කවරේද යන්න බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් විමර්ශනය කරන්න.
(ලකුණු 20 යි.)

05. ගෘහ ආර්ථික කළමනාකරණයේ වැදගත්කම බෞද්ධ සූත්‍ර ධර්ම ඇසුරෙන් පෙන්වා දෙන්න.
(ලකුණු 20 යි.)

06. සංවර්ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය පිළිබඳ විවරණයක් කරන්න.
(ලකුණු 20 යි.)

***

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය - ශ්‍රී ලංකාව

## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

### බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

### 2025 නොවැම්බර්

## MABS 1264- බෞද්ධ කලා හා ගෘහ නිර්මාණ

ප්‍රශ්න සංඛ්‍යාව 06 කාලයඃ පැය දෙකයි (02)

---

ප්‍රශ්න **තුන(03)**කට පමණක් පිළිතුරු සපයන්න.

---

01. ශ්‍රී ලාංකේය බෞද්ධ ගෘහ නිර්මාණ කලාවේ උසස් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කෙරෙන සාක්ෂ්‍ය පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 20 යි.)

02. දාගැබ් හෙවත් ස්ථූපය ආශ්‍රිත ව ගොඩනැගී ඇති අංගයන්හි හමුවන කැටයම් කලාව
    හෝ
    සඳකඩ පහණේ විකාශය, විස්තර, අර්ථකථන ඇසුරෙන් කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 20 යි.)

03. බුදු පිළිමයේ හඳුනාගත හැකි කලාත්මක අංගයන් උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 20 යි.)

04. බෝධිසත්ත්ව රූප හෝ තාරා රූපවල අංග ලක්ෂණ, ආගමික පසුබිම ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 20 යි.)

05. අනුරාධපුර යුගයේ හා පොළොන්නරු යුගයේ බිතු සිතුවම්වල විශේෂ ලක්ෂණ හා කලාත්මක සුවිශේෂතා සංසන්දනාත්මකව විස්තර කරන්න. (ලකුණු 20 යි.)

06. මහනුවර යුගයේ බිතු සිතුවම්වල දෘශ්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20 යි.)

***